# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

# පුරප්පාඩු

# ත්‍රීරෝද රථ රියදුරු තනතුර

අධ්‍යාපන සුදුසුකම : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක යටත් පිරිසෙයින් සම්මාන දෙකක (02) සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම :
i. සැහැල්ලු වාහන බලපත්‍රයක් (Light Vehicle License) තිබීම.
ii. A1 / A කාණ්ඩයට (Motor tricycle, Three Wheeler / Auto / Manual) අයත් බලපත්‍රය තිබීම අනිවාර්ය වේ.

වයස : වයස අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් කේතය : PL2 – III ශ්‍රේණිය

වැටුප් පරිමාණය : රු. 56400 - 10 X 650 - 62900

කායික සුදුසුකම් :
i. සෑම අපේක්ෂකයෙකුම තනතුරේ රාජකාරී ඉටුකිරීමටත්,දිවා රාත්‍රි කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුරවලට රාජකාරී සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ii. අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.
iii. මාර්ග නීති පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය.
iv. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමානවල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස හා දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.

v. වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :
1. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට ප්‍රථම නුගේගොඩ ජාතික වෛද්‍ය ආයතනය මගින් වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී එහි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
2. අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

පත් කිරීමේ කොන්දේසි : තෝරා ගන්නා අයදුම්කරුවන් පත්වීමේ දින සිට එක් වසරක පරිවාස කාලයකට යටත් වෙනු ඇත.

**තනතුරට පත් කර ගැනීමේ හෝ පත්කර නොගැනීමේ බලය ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය සතුවේ.**

අයදුම්කරුවන් තමන් විසින් සකස් කර ගන්නා ලද සියලු තොරතුරු ඇතුළත් (උස සඳහන් කරමින්) අයදුම්පත් රියදුරු බලපත්‍රයේ පිටපතක් සහිතව **2026.02.02** වන දිනට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**